2024 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

වැය ශීර්ෂ අංකය : 274

අන්තර්ගතය

පරිච්ඡේදය	01	-	ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය
පරිච්ඡේදය	02	-	ප්‍රගතිය හා ඉදිරි දැක්ම
පරිච්ඡේදය	03	-	වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය
පරිච්ඡේදය	04	-	කාර්යසාධන දර්ශක
පරිච්ඡේදය	05	-	තිරසර සංවර්ධන අරමුණු (SDGs) සපුරා ගැනීමේ කාර්යසාධනය
පරිච්ඡේදය	06	-	මානව සම්පත් පැතිකඩ
පරිච්ඡේදය	07	-	අනුකූලතා වාර්තාව

01 පරිච්ඡේදය -ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරංශය **3 - 9**

1.1	හැඳින්වීම	3
1.2	ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු	4
1.3	ප්‍රධාන කාර්යයන්	5
1.4	සංවිධාන සටහන	6
1.5	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා අංශ	7-9

02 පරිච්ඡේදය -ප්‍රගතිය හා ඉදිරි දැක්ම **10 - 13**

2.1	ප්‍රගතිය හා විශේෂ ළඟාකර ගැනීම්	10-12
2.2	අභියෝග	12
2.3	ඉදිරි ඉලක්ක	13

03 පරිච්ඡේදය -වසරේ සමස්ථ මූල්‍ය කාර්යසාධනය **14-33**

3.1	මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශය	14-15
3.2	මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	16
3.3	මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය	17-18
3.4	මූල්‍ය ප්‍රකාශ සටහන්	-
3.5	ආදායම් එකතු කිරීමේ කාර්යය සාධනය	19
3.6	වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යය සාධනය	19
3.7	මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන	20-22
3.8	මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යය සාධනය	23
3.9	විගණකාධිපතිවරයාගේ වාර්තාව	24-33

04 පරිච්ඡේදය -කාර්යය සාධන දර්ශක **34**

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යය සාධනය **35**

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු 35

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 35

06 පරිච්ඡේදය -මානව සම්පත් පැතිකඩ **36-37**

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 36

6.2 ආයතනයේ කාර්යය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාරය 36

6.3 මානව සම්පත් සංවර්ධනය 37

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව **38-43**

01 පරිච්ඡේදය


ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ප්‍රථම රාජධානිය වන අනුරාධපුරය, බහු ආගමික, බහු භාෂික ජනතාවක් ජීවත්වන ඓතිහාසික වශයෙන් ඉතා වැදගත්කමක් ඇති ශ්‍රී ලංකාවේ විශාලතම දිස්ත්‍රික්කයයි. එය විශාලත්වයෙන් වර්ග කි.මී. 7,179 ක් වන අතර මුළු භූමි ප්‍රමාණය ශ්‍රී ලංකාවේ භූමි ප්‍රමාණයෙන් 11% කි. එය උතුරු මැද පළාතේ මුළු භූමි ප්‍රමාණයෙන් 68.5% ක ප්‍රමාණයක් අත්කර ගනී. උතුරින් වවුනියා දිස්ත්‍රික්කය ද දකුණින් මාතලේ හා කුරුණෑගල දිස්ත්‍රික්ක ද බටහිරින් මන්නාරම් හා පුත්තලම් දිස්ත්‍රික්ක ද නැගෙනහිරින් ත්‍රිකුණාමලය හා පොළොන්නරුව දිස්ත්‍රික්කවලින් ද මායිම්ව උතුරු මැද පළාත තුළ මෙම දිස්ත්‍රික්කය පිහිටා ඇත. නුවරවැව, කලාවැව, පදවිය වැව, තිසා වැව ආදි විශාල වැව් 13 කින් ද මධ්‍යම පරිමාණ වැව් 87කින් ද කුඩා වැව් 2,990 කින් ද සමන්විත දිස්ත්‍රික්කයේ අභ්‍යන්තර ජලාශවල විශාලත්වය වර්ග කිලෝ මීටර 145 කි. එම නිසාම වැව් බැඳි රාජ්‍යය ලෙස ද හඳුන්වයි.

වියලි කලාපීය දේශගුණයකින් සමන්විත වන මෙම දිස්ත්‍රික්කයේ 2024 වර්ෂයේ උපරිම උෂ්ණත්වය සෙල්සියස් අංශක 35.9 ක් වන අතර අවමය සෙල්සියස් අංශක 23.4 ක් වේ. සාමාන්‍ය වර්ෂාපතනය මිලි මීටර් 129.91 ක් පමණ වේ. (මූලාශ්‍රය - කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව)

පරිපාලනමය වශයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 22 කින් සමන්විත දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරී කොට්ඨාස ගණන 694 ක් වන අතර මුළු ගම් ගණන 2,584 කි. 2024 වර්ෂයට අදාළව ඇස්තමේන්තු ගත පවුල් ඒකක 255,022 ක් වන අතර ඇස්තමේන්තු ගත මුළු ජනගහනය 943,581 ක් වේ. මැතිවරණ කොට්ඨාස 07 කින්ද, පළාත් පාලන ආයතන වශයෙන් ප්‍රාදේශීය සභා 18 කින් සහ මහ නගර සභා 01 කින් සමන්විතය. මෙම ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය කෘෂිකර්මාන්තයයි. - (මූලාශ්‍රය - සංඛ්‍යා ලේඛන අංශය, අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය)



1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

1.2.1 දැක්ම

“උරුමයන් සුරක්ෂිත තිරසර සංවර්ධනයක්, ප්‍රශස්ත රාජ්‍ය සේවාවක් ”

1.2.1 මෙහෙවර

“ දිස්ත්‍රික්කයේ උරුමයන් සුරකිමින්, යහපාලන මූලධර්මයන්ට අනුකූලව රාජ්‍ය ප්‍රතිපත්ති හා අනුගතව මානව අවශ්‍යතා හා පාරිසරික සුරක්ෂිතභාවය තහවුරු කරමින් සම්පත් ප්‍රශස්තව කළමනාකරණය කිරීම.


1.2.2 අරමුණු

1. දිස්ත්‍රික් හා ප්‍රාදේශීය පරිපාලනයට අදාළ ව්‍යවස්ථාපිත කාර්යයන් කාර්යක්ෂමව ඉටු කිරීම
2. ඉඩම් කළමනාකරණය
3. යටිතල පහසුකම් සංවර්ධනය
4. සේවා නියුක්තිය හා ව්‍යවසායකත්ව සංවර්ධනය
5. සමාජ සවිබල ගැන්වීම, ආරක්ෂණය හා අධ්‍යාත්මික සංවර්ධනය
6. පරිසර සංරක්ෂණය
7. ආපදා කළමනාකරණය
8. තිරසර කෘෂිකාර්මික ප්‍රවර්ධනය

1.3 ප්‍රධාන කාර්යයන්

අරමුණු	ප්‍රධාන කාර්යයන්
දිස්ත්‍රික් හා ප්‍රාදේශීය පරිපාලනයට අදාළ ව්‍යවස්ථාපිත කාර්යයන් කාර්යක්ෂමව ඉටු කිරීම	1. නව තාක්ෂණය අනුගත කිරීම තුළින් කාර්යක්ෂම රාජ්‍ය යාන්ත්‍රණයක් ඇති කිරීම 2. විධිමත් තොරතුරු කළමනාකරණය 3. අල්ලස හා දූෂණය පිටු දැකීම
ඉඩම් කළමනාකරණය	1. රජයේ ඉඩම් හඳුනා ගැනීම /ආරක්ෂා කර ගැනීම 2. සංවර්ධනය සඳහා ඉඩම් නිදහස් කිරීම 3. ඉඩම් නීත්‍යානුකූල කිරීම සඳහා ප්‍රාදේශීය පරිපාලනය හා ආයතන සම්බන්ධීකර
යටිතල පහසුකම් සංවර්ධනය	දිස්ත්‍රික්කයේ යටිතල පහසුකම් සංවර්ධනයට අවශ්‍ය i. සංවර්ධනය කළ යුතු ස්ථාන හඳුනා ගැනීම ii. ප්‍රමුඛතාගතකරණය iii. ව්‍යාපෘති/ ඇස්තමේන්තු සකස් කිරීම iv. ව්‍යාපෘති අනුමත කිරීම v. අධීක්ෂණය, මෙහෙයවීම, සම්බන්ධීකරණය හා පසුවිපරම
සේවා නියුක්තිය හා ව්‍යවසායකත්ව සංවර්ධනය	1. දිස්ත්‍රික්කයේ ජනතාව ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම 2. දේශීය කර්මාන්ත ගොඩනැගීම සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කිරීම 3. ග්‍රාමීය කාන්තා හා තරුණ ව්‍යවසායක ප්‍රවර්ධනය 4. ඒකත්තීය පුහුණුව තුළින් පුහුණු ක්‍රියාශීලි ශ්‍රම බලකායක් බිහි කිරීම 5. ව්‍යවසායකත්ව සංවර්ධනයට අවශ්‍ය පහසුකම් සම්පාදනය
සමාජ සවිබල ගැන්වීම, ආරක්ෂණය හා ආධ්‍යාත්මික සංවර්ධනය	1. සංවර්ධන ක්‍රියාවලිය සඳහා කාන්තාවන් / වෙනස් හැකියාවන් හෝ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්/ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට සමාන අවස්ථා සැලසීම තුළින් ආර්ථික හා සමාජයීය වශයෙන් සවිබල ගැන්වීම 2. ළමා ආරක්ෂාව තහවුරු කිරීම, නිරෝගී බව හා පෝෂණය ප්‍රවර්ධනය සහ පූර්ව ළමාවිය සංවර්ධනය 3. සමාජයීය ආධ්‍යාත්මික සමබරතාව ඉහළ නැංවීම
පරිසර සංරක්ෂණය	1. පරිසර දූෂණය වැළැක්වීම හා සංරක්ෂණය පාදක කර ගනිමින් පාරිසරික ව්‍යවසායකත්ව දිරි ගැන්වීම 2. පරිසරයට එකතු වන අපද්‍රව්‍ය ප්‍රමාණය අවම කිරීම, නැවත පරිභෝජනයට ගැනීම හා ප්‍රතිචක්‍රීකරණය 3. හරිත බව ප්‍රවර්ධනය හා එහි ප්‍රතිලාභ ජනතාව වෙත ලැබෙන බව තහවුරු කිරීම
ආපදා කළමනාකරණය	1. ජීවිත හා දේපළ ආපදාවන්ගෙන් ආරක්ෂා කිරීම හා ආර්ථිකමය හානිය අවම කිරීම 2. ස්වභාවික ආපදාවන්ට මුහුණ දිය හැකි ශක්තිමත් ප්‍රජාවක් බිහි කිරීම
තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය	1. පරිසර හිතකාමී කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය 2. ආහාර සුරක්ෂිතතාව ඉහළ නැංවීම 3. අගය එකතු කළ ආහාර නිෂ්පාදනය සඳහා අවස්ථාව සලසා දීම තුළින් ජනතාවගේ ආර්ථික තත්ත්වය ඉහළ නැංවීම 4. යෝග්‍ය වගා ක්‍රම හඳුන්වා දීම

1.4 සංවිධාන සටහන



CamScanner

1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු / දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ / දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල

1.5.1. ප්‍රාදේශීය ලේකම් කාර්යාල

පරිපාලනමය වශයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 22 කින් සමන්විත දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරී කොට්ඨාස ගණන 694 ක් වන අතර මුළු ගම් ගණන 2,584 කි. 2024 වර්ෂයට අදාළව ඇස්තමේන්තු ගත පවුල් ඒකක 255,022 ක් වන අතර ඇස්තමේන්තුගත මුළු ජනගහනය 943,581 ක් වේ. මැතිවරණ කොට්ඨාස 07 කින්ද, පළාත් පාලන ආයතන වශයෙන් ප්‍රාදේශීය සභා 18 කින් සහ මහ නගර සභා 01 කින් සමන්විතය.

(මූලාශ්‍රය - සංඛ්‍යා ලේඛන අංශය, අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය)

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්යයභාරය

- ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල මානව සම්පත්/ භෞතික සම්පත්/ මූල්‍ය සම්පත් ප්‍රශස්ත කළමනාකරණය සහ අධීක්ෂණය
- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මානව සම්පත්/ භෞතික සම්පත්/ මූල්‍ය සම්පත් ප්‍රශස්ත කළමනාකරණය සහ අධීක්ෂණය
- දිස්ත්‍රික්/ ප්‍රාදේශීය පාලනයට අදාළ වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු අතර සම්බන්ධීකරණය

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය (Divisional Secretariat)		වර්ග ප්‍රමාණය (ව.කි.මී) – Area (km2)	ග්‍රාම නිලධාරී කොට්ඨාස ගණන No of G.N. Division
1	පදවිය	240	15
2	කැබිතිගොල්ලෑව	615	26
3	මැදවච්චිය	482	37
4	රඹෑව	309	38
5	හොරොව්පොතාන	845	38
6	ගලෙන්බිදුණුවැව	291	41
7	කහටගස්දිගිලිය	352	40
8	නැගෙනහිර නුවරගම් පළාත	403	29
9	මධ්‍යම නුවරගම් පළාත	91	40
10	මහවිලච්චිය	635	17
11	නොච්චියාගම	813	36
12	තලාව	234	39
13	තඹුත්තේගම	117	26
14	රාජාංගනය	101	21
15	ගල්නෑව	138	30
16	ඉපලෝගම	147	32
17	මිහින්තලේ	228	25
18	තිරප්පනේ	294	41
19	කැකිරාව	331	53
20	පලුගස්වැව	201	16
21	පලාගල	225	35
22	නාච්චාදූව	87	19
එකතුව		**7,179**	**694**

1.5.2. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අංශ හා ප්‍රධාන කාර්යයන්

1 ආයතන අංශය

a. දිස්ත්‍රික් හා ප්‍රාදේශීය පරිපාලනයට අදාළ මානව සම්පත් කළමනාකරණය
b. කාර්යාල කළමනාකරණය

2 ගිණුම් අංශය

a. දිස්ත්‍රික් හා ප්‍රාදේශීය පරිපාලනයට අදාළ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය
b. ප්‍රසම්පාදන කළමනාකරණය
c. වත්කම් කළමනාකරණය

3 සංවර්ධන අංශය

a. ප්‍රාදේශීය පරිපාලන යාන්ත්‍රණය ශක්තිමත් කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරු දැනුවත් කිරීමේ සාකච්ඡා / රැස්වීම් සංවිධානය
b. ස්වදේශ කටයුතු චක්‍රලේඛ 25/2019 අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරීක්ෂාව සිදු කිරීම මගින් අධීක්ෂණය හා කාර්යයන් සඳහා නිශ්චිත ක්‍රමවේද සකස් කිරීම සඳහා සහාය වීම
c. අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු/ආයතන මගින් නියම කර ඇති හෝ ප්‍රතිපාදන වෙන් කිරීම් මත ක්‍රියාත්මක වැඩසටහන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා ගෙවීම් කිරීමට සහාය වීම
d. ජාතික වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සහාය වීම
e. අස්වැසුම සුභසාධන ප්‍රතිලාභ ගෙවීම් වැඩ සටහන දිස්ත්‍රික් සම්බන්ධීකරණ කටයුතු
f. ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙහි හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයයෙහි රජයේ සංචාරක නිකේතන වෙන් කිරීම හා අධීක්ෂණ කටයුතු
g. 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතේ විධිවිධාන ප්‍රකාරව තොරතුරු සැපයීම
h. 1980 අංක 31 දරණ ස්වේච්ඡා සමාජ සංවිධාන ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීමේ පනතෙහි විධිවිධාන අනුව දිස්ත්‍රික්කය තුළ රාජ්‍ය නොවන සංවිධාන මගින් ක්‍රියාත්මක වැඩ සටහන් නියාමනය කිරීම හා දිස්ත්‍රික්කය තුළ දේශීය අරමුදලින් ක්‍රියාත්මක කරන රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචිය හා රාජ්‍ය නොවන සංවිධාන දිස්ත්‍රික් සම්බන්ධීකරණය.

4 ඉඩම් අංශය

a. ඉඩම් කළමනාකරණයට අදාළ තොරතුරු, ප්‍රාදේශීය පරිපාලනය හා රාජ්‍ය ආයතන අතර හුවමාරුව
b. රජය මගින් ඉඩම් හා ඉඩම් සංවර්ධනය සම්බන්ධව සිදු කරන විවිධ ව්‍යාපෘති/ වැඩසටහන් අධීක්ෂණය හා සම්බන්ධීකරණය (උදා : සීමා නිර්ණය, යාන් ඔය හා පහළ මල්වතු ඔය ජලාශ ව්‍යාපෘති)

05. සැලසුම් අංශය

a. දිස්ත්‍රික්කයේ යටිතල පහසුකම් සංවර්ධනයට අවශ්‍ය
   i. සංවර්ධනය කළ යුතු ස්ථාන හඳුනා ගැනීම
   ii. ප්‍රමුඛතාගතකරණය
   iii. ව්‍යාපෘති / ඇස්තමේන්තු සකස් කිරීම
   iv. ව්‍යාපෘති අනුමත කිරීම
   v. අධීක්ෂණය, මෙහෙයවීම, සම්බන්ධීකරණය හා පසුවිපරම සඳහා දිස්ත්‍රික් ලේකම්ට සහාය වීම
b. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව පැවැත්වීම.
c. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික සැලැසුම් හා සම්පත් පැතිකඩ සකස් කිරීම
d. ආහාර අවශ්‍යතා ප්‍රමුඛ කරගෙන නිෂ්පාදන පරිමාව වර්ධනය කිරීම, ආහාර සුරක්ෂිතතාව, පෝෂණය හා දිළිඳුකම අවම කිරීම අරමුණු කර ගනිමින් ප්‍රජාව ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම, නව රැකියා උත්පාදනය/ ප්‍රවර්ධනය, අපනයන ප්‍රවර්ධනය වැනි හඳුනාගනු ලබන සංවර්ධන ක්ෂේත්‍රයන් තුළින් ග්‍රාමීය ආර්ථික පුනර්ජීවනය ඇති කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
e. වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මගින් දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක කරන සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම/ සම්බන්ධීකරණය

6.ඉංජිනේරු අංශය

a. දිස්ත්‍රික් ලේකම් කාර්යලායේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
b. වෙනත් රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවල ඉදි කිරීම් ව්‍යාපෘති සඳහා උපදේශාත්මක සේවා සැපයීම
c. දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක ඉදිකිරීම් හා සේවා සැපයීමට අදාල ද්‍රව්‍ය, ශ්‍රමය හා සේවා සඳහා මිල නියම කිරීම

7.අභ්‍යන්තර විගණන අංශය

a. වාර්ෂික විගණන සැලැස්ම පරිදි අභ්‍යන්තර විගණනය සිදුකර අනාවරණය කරගත් අඩුපාඩු හා නිර්දේශ සාකච්ඡා කිරීමේ යාන්ත්‍රණයක් ලෙස කළමනාකරණ විගණන චක්‍රලේඛ DMA/01/2019 අනුව කාර්තුගත විගණන හා කළමනාකරණ දිස්ත්‍රික් කමිටු රැස්වීම් 04 ක් පැවැත්වීම හා ප්‍රාදේශීය කමිටු 4 බැගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22 හි ම පැවැත්වීම

b. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22 හි අභ්‍යන්තර විගණන කටයුතු හා අවශ්‍ය අවස්ථාවන්වල දී විමර්ශන සිදු කිරීම

8. තොරතුරු තාක්ෂණ අංශය

c. කාර්යය මණ්ඩලය සඳහා අන්තර්ජාල පහසුකම් හා විද්‍යුත් තැපෑල පහසුකම් සැපයීම
d. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම හා සංවර්ධනය
e. අවශ්‍ය දත්ත පද්ධති හා මෘදුකාංග සංවර්ධනය සහ තොරතුරු තාක්ෂණ සේවා සැපයීම
f. පරිගණක නඩත්තුව හා කාර්යාලය තුල ජාල පද්ධතිය (Local Area Network) නඩත්තුව
g. කාර්යය මණ්ඩලයේ පරිගණක සාක්ෂරතාව ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පුහුණුව ලබාදීම

9. ජාතික පොහොර ලේකම් කාර්යාලය - දිස්ත්‍රික් කාර්යාලය

1988 අංක 68 දරණ පොහොර විධිමත් කිරීමේ පනත යටතේ පිහිටුවා ඇති ජාතික පොහොර ලේකම් කාර්යාලයේ අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාලය ලෙස කටයුතු කරමින් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණයෙන් පොහොර සම්බන්ධ කටයුතු නියාමනය කිරීම

10. පුපුරණ ද්‍රව්‍ය අංශය

1956 අංක 21 දරණ පුපුරණ ද්‍රව්‍ය ආරක්ෂණ පනතට අනුව ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමතියට යටත්ව දිස්ත්‍රික් අවශ්‍යතාව සඳහා පුපුරණ ද්‍රව්‍ය අවසර පත්‍ර හා බලපත්‍ර නිකුත් කිරීම

11. ක්ෂේත්‍ර නිලධාරී අංශය

අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු මගින් නියම කර ඇති හෝ ප්‍රතිපාදන වෙන් කිරීම් මත ක්ෂේත්‍ර නිලධාරීන් මගින් ක්‍රියාත්මක වැඩසටහන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා ගෙවීම් කිරීමට සහායවීම.

<u>සම්බන්ධීකරණ සේවා</u>

1. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
2. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
3. ජාතික පොහොර ලේකම් කාර්යාලය
4. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව - දිස්ත්‍රික් කාර්යාලය
5. දිස්ත්‍රික් සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය
6. ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලය
7. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැණීම් කාර්යාංශය - දිස්ත්‍රික් කාර්යාලය
8. මැතිවරණ දෙපාර්තමේන්තුව - දිස්ත්‍රික් කාර්යාලය
9. ජාතික විගණන කාර්යාලය - දිස්ත්‍රික් කාර්යාලය
10. සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව - දිස්ත්‍රික් කාර්යාලය
11. ජාතික ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය - දිස්ත්‍රික් කාර්යාලය
12. අන්තර් පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලය
13. ඉඩම් පරිහරණ සැලසුම් දෙපාර්තමේන්තුව - දිස්ත්‍රික් කාර්යාලය
14. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය - දිස්ත්‍රික් කාර්යාලය
15. මිණුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව (කිරුම් මිණුම් අංශය)

02 පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 ප්‍රගතිය සහ විශේෂ ළඟාකර ගැනීම්

01 .

I. සම්පත් පැතිකඩ සකස් කිරීම හා වාර්ෂික සැලසුම් සකස් කිරීම.

II. 2024 අයවැය ප්‍රතිපාදන යටතේ වැඩසටහන් 8 ක් යටතේ ප්‍රාදේශීය සංවර්ධනය ඉහළ නැංවීම තුලින් ග්‍රාමීය ජනතාවගේ විවිධ පැතිකඩ ඔස්සේ ඔවුන්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීම, දිස්ත්‍රික්කය සඳහා වෙන් වූ රුපියල් මිලියන 1,251 ප්‍රතිපාදන වලට අදාල සියළු ව්‍යාපෘති නියමිත පිරිවිතරයන්ට අනුව ඒ ඒ වැඩසටහනට නියමිත කාලයට පෙර ව්‍යාපෘති 2,686 ක් අවසන් කිරීම.

III. දිස්ත්‍රික්කයේ පවතින දරිද්‍රතාවය හා දිළිඳුකම නිසා පහත වැටී ඇති ග්‍රාමීය ප්‍රාථමික පාසල් වල දරුවන්ගේ පෝෂණ මට්ටම වැඩි කිරීම හා දරුවන්ගේ දෛනික පාසල් පැමිණීමේ මට්ටම වැඩි කිරීම තුළින් දරුවන්ගේ අධ්‍යාපන මට්ටම වැඩි දියුණු කිරීම, පාසල් සඳහා දිවා ආහාරය සපයනු ලබන ආහාර සැපයුම් කරුවන්ගේ පහසුකම් සංවර්ධනය කිරීම තුලින් අහාර වේලේ ගුණාත්මකභාවය හා පෝෂණ මට්ටම ඉහල නැංවීම, දරුවන් පාසල් පැමිණීමේ ප්‍රතිශතය ඉහළ නැංවීම මෙන්ම පාසල් දරුවන්ගේ මන්ද පෝෂණය පහළ නැංවීම ඉලක්ක කොට බිත්තර සඳහා කිකිළියන් ඇති කිරීමේ ව්‍යාපෘති 394 ක් ස්ථාපිත කිරීම (කිකිළි පැටවි 55 බැගින්)

02. අස්වැසුම සුබසාධන ප්‍රතිලාභ ගෙවීම් පිණිස සුදුසු තැනත්තන් හඳුනාගැනීමේ වැඩ සටහනේ පළමු අදියර යටතේ ඉදිරිපත් වූ මුළු අයදුම්පත් සංඛ්‍යාව 173,622 ක් වූ අතර දත්ත පරික්ෂා කිරීමෙන් පසු තෝරාගත් අයදුම්පත් සංඛ්‍යාව 160,857 කි. ඉන් සුදුසුකම් ලැබූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව 73,732 කි (2024.12.31 දිනට). මේ අතර අන්ත දිළිඳු (Severely poor) සංඛ්‍යාව 8,243 ක් ද , දිළිඳු (Poor) සංඛ්‍යාව 27,423 ක් ද, අවදානම් (Vulnerable) සංඛ්‍යාව 20,320 ක් වන අතර සංක්‍රාන්ති (Transient) සංඛ්‍යාව 17,746 ක් වේ. අස්වැසුම සඳහා ඉදිරිපත්වූ අභියාචනා සංඛ්‍යාව 47,661 ක් වූ අතර විරෝධතා සංඛ්‍යාව 4,755 ක අස්වැසුම සුබසාධන ප්‍රතිලාභ ගෙවීම් පිණිස සුදුසු තැනත්තන් හඳුනාගැනීමේ වැඩ සටහනේ දෙවන අදියර යටතේ ඉදිරිපත් වූ මුළු අයදුම්පත් සංඛ්‍යාව 68,411 කි.

03. 2024 වර්ෂයේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ අඩු ආදායම්ලාභී පවුල් වෙත බෙදාදීම සඳහා සහල් සැපයුම්කරුවන් 72 කු ගෙන් කිලෝ 10 සහල් බෑග් නාඩු කැකුළු සහල් 198,468 ක්ද, නාඩු රතු කැකුළු සහල් 25,341 ක්ද, නාඩු තැම්බු සහල් 78,615 ක් වශයෙන් මුළු සහල් බැග් ගණන 302,424 ක් මිලදී ගත් අතර ඒ සඳහා රුපියල් 579,255,570.00 ගෙවීම් කර ඇත.

04. අනුරාධපුර දිස්ත්‍රික්කයේ ආපදා සහන සේවා අංශය මගින් 2024 වර්ෂය සඳහා නිවාස හානි සංඛ්‍යාව 479 ක් හා ව්‍යාපාර හානි සංඛ්‍යාව 18 ක් සඳහා ගෙවන ලද වන්දි මුදල රුපියල් 17,216,202.56 කි. එමෙන්ම දිස්ත්‍රික්කයේ හදිසි ස්වභාවික ආපදා මරණ සංඛ්‍යාව 04 ක් වන්දි වශයෙන් රුපියල් 750,000.00 ක්ද පිසු ආහාර සඳහා රුපියල් 533,850.00ක්ද, වියළි සලාක සඳහා රුපියල් 1,304,800.00 ක් වැයවී ඇත. හදිසි ආපදා කඩිනම් ප්‍රතිචාර සඳහා රුපියල් 1,706,246.66 විය. එමෙන්ම නැවත පදිංචි කිරීමේ වැඩසටහන සඳහා රුපියල් 900,000.00 කි.

05.

I. සමෘද්ධි සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය මගින් ජීවනෝපාය සංවර්ධන වැඩ සටහන් යටතේ නව සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ ගම්මාන (One village one product) වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් 161 සඳහා වියදම රුපියල් 11,512,050.00 කි. සමෘද්ධි අලෙවි සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රතිපාදන රුපියල් 524.500.00ක් වන අතර වියදම රුපියල් 351,160.00කි.

II. භාණ්ඩාගාර ප්‍රතිපාදන තුලින් ක්‍රියාත්මක ව්‍යාපෘති සඳහා අනුමත මුදල රුපියල් 1,380,000.00 වන අතර වියදම රුපියල් 1,343,890.00කි.

III. එමෙන්ම සමෘද්ධි හා අඩු ආදායම්ලාභී පවුල්වල තරුණ තරුණියන් සඳහා ජපන් භාෂා ප්‍රවීණතාවය ලබාදීමට පහසුකම් සැලසීමේ වැඩ සටහන යටතේ ප්‍රතිලාභී සිසුන් 406 ක් සඳහා වැය මුළු වියදම රුපියල් 2,726,315.00 කි.

IV. අධ්‍යයන වර්ෂ 2022-2024 සිප්දොර ශිෂ්‍යත්ව සඳහා ප්‍රතිලාභ ගෙවීම යටතේ අනුමත ශිෂ්‍ය සංඛ්‍යාව 815 ක් වන අතර ඒ සඳහා ගෙවූ මුදල් ප්‍රමාණය රුපියල් 15,147,000.00 කි.

V. සෞභාග්‍යා නිවාස ඉදිකිරීම් ව්‍යාපෘතිය යටතේ මුළු නිවාස 92 ක් ඉදිකිරීම සඳහා රුපියල් 44,000,000.00 කි.

VI. සමාජ සංවර්ධන වැඩසටහන් යටතේ මත්ද්‍රව්‍ය නිවාරණ, ළමා සමාජ හා සංස්කෘතික, ජාත්‍යන්තර දින වැඩ සටහන් හා ගෘහ කළමනාකරණය දැනුවත් කිරීම යන වැඩ සටහන් සංඛ්‍යාව 161 ක් වන අතර ඒ සඳහා වැය කළ මුදල රුපියල් 1,400,950.00 කි.

06. 2024 වර්ෂයේ වන අලින්ගෙන් සිදු වූ ජීවිත හානි 32ක් ශාරීරික හානි 63ක් හා දේපල හානි 1,130 ක් සිදුවි ඇති අතර 2024 වර්ෂයේ වන්දි කමිටුව මගින් අනුමත සමස්ථ වන්දි ගෙවීම් ජීවිත හානි සඳහා රු.31, 900,000.00 ක්ද ශාරීරික හානි සඳහා රුපියල් 4,029,382.76 ක්ද දේපල හානි සඳහා වන්දි රුපියල් 61,000,819.37 ක් වශයෙන් වූ මුළු ගෙවීම් ප්‍රමාණය රුපියල් 96,930,202.13 කි.

07. 2024 වර්ෂයේ දී වගා ආරක්ෂණ ගිනිඅවි අලුත් කිරීම් 1291 ක් ද දේපල ආරක්ෂාව ගිනිඅවි අලුත් කිරීම් 08 කි. එමෙන්ම රාජ්‍ය/බැංකු ආයතන සඳහා වන ගිනිඅවි අලුත් කිරීම් 325 ක්ද නව ගිනිඅවි නිර්දේශ කිරීම් 64 කි. ගිනිඅවි පැවරුම් නිර්දේශ කිරීම් 08 ක්ද ගිනිඅවි අධිකාරිත්වය මාරුකිරීම් 03 කි.

08 අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 22ම ආවරණය වන පරිදි උදු හා මුං වගා ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 10.89 ක් ද දිස්ත්‍රික්කයේ ඉඩම් හෙක්ටයාර් 320 ක උදු හා මුං වගා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ අතර, ප්‍රතිලාභීන් 1,449 සඳහා වියදම් කළ මුදල රුපියල් 10,884,299.00 කි. රඹෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පල්ලන්කුලම ග්‍රාම නිලධාරී වසමේ එළවළු , පළතුරු හා ධාන්‍ය අගය එකතු කිරීම් හා නිෂ්පාදන විවිධාංගිකරණය මගින් ග්‍රාමීය ප්‍රජාව ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම.

09. දිස්ත්‍රික්කයේ වැඩිහිටි කටයුතු සම්බන්ධයෙන් වැඩිහිටියන් 62 ක් සඳහා සුව පහසුකම් සැපයීම වෙනුවෙන් රුපියල් ලක්ෂ 20 ක්ද , ආරෝග්‍යා වැඩ සටහන සඳහා ප්‍රතිලාභීන් 117 ක් සඳහා රුපියල් 150,000.00 ක්ද, වැඩිහිටි වන්දනා චාරිකා සඳහා ප්‍රතිලාභීන් 16 ක් සඳහා වියදම රුපියල් ලක්ෂ 600,000.00 ක්ද , ග්‍රාමීය වැඩිහිටි සමිති සවිබල ගැන්වීම සඳහා සමිති 48 ක් සඳහා රුපියල් 605,300.00 කි.

ස්වයං රැකියා උත්පාදනය සඳහා ආධාර ලබාදීම ප්‍රතිලාභීන් 37 දෙනකු සඳහා 350,000.00 ක්ද වැඩිහිටි නිවාස, දිවා මධ්‍යස්ථාන ඉදිකිරීම්, අලුත්වැඩියා හා උපකරණ ලබාදීම සඳහා රුපියල් 2,000,000.00 ක්ද දිරියපියස යටතේ රුපියල් 2,100,000.00 කට අමතරව ආධාරක උපකරණ ලබාදුන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව 151 කි.

10. අලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා අනුරාධපුර දිස්ත්‍රික්කයේ අනුරාධපුර වන ජීවී කළාපයේ පළමු අදියරේ විදුලි වැට 05 න් 4ක වැඩ අවසන් කිරීම හා වව්නියාව වන ජීවී කළාපයේ ආරක්ෂිත විදුලි වැට 02න් 01 ක වැඩ නිම කිරීම.

රජයේ නිවාස අලුත් වැඩියා කටයුතු සිදුකිරීම, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල අලුත් වැඩියා කටයුතු .

11. ගර්භනී මව්වරුන් සඳහා රුපියල් 45,000.00ක පෝෂණීය දීමනාව ලබාදීමේ වැඩසටහන යටතේ ප්‍රතිලාභී මව්වරුන් 9,122 දෙනකු සඳහා රුපියල් 356,279,632.77 වියදම් දැරීම හා පෙර පාසල් දරුවන් සඳහා උදෑසන ආහාර වේල ලබාදීමේ වැඩසටහන යටතේ දරුවන් 8,840 ක් සඳහා රුපියල් 79,387,980.00 ක්ද ගුරු අභිමානී පෙර පාසල් ගුරුවරු සඳහා දීමනාවක් ලබාදීමේ ගුරුවරුන් 867දෙනකු සඳහා 21,454,500.00 වියදම් දැරීම.

12. අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සංචාරක නිවාසය වෙන් කිරීම මගින් 2024 වර්ෂයට අදාළව රු.1,013,500.00 ක ආදායම් ඉපයීම .

13. සංවර්ධන නිලධාරීන්ගේ මනෝ සමාජීය පුහුණු වැඩසටහන හා විගමනික ප්‍රජාව සඳහා මනෝ සමාජීය පුහුණු වැඩසටහන් මෙන්ම ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන් පැවැත්වීම.

14. වර්ෂයේ දිස්ත්‍රික් සංස්කෘතික උත්සවය මෙන්ම විවිධ සංස්කෘතික හා ආගමික වැඩසටහන් සංවිධානය කිරීම හා සංස්කෘතික මධ්‍යස්ථාන සංවර්ධන කටයුතු සිදු කිරීම.

15. දිස්ත්‍රික්කයේ රැකියා වියුක්තිය අවම කරවීම සඳහා පාසල් හැරගිය තරුණ තරුණියන්, ශීෂ්‍යයින්, දෙමාපියන්, රාජ්‍ය නිලධාරීන් සඳහා මානව හා නිපුණතා සංවර්ධන පුහුණු වැඩසටහන්/ රැකියාපොල ක්‍රියාත්මක කිරීම

16. අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 22ක සඳහා සමාජ සේවා දෙපාර්තමේන්තුව හා අබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලය මගින් සිදු කරන ලද අබාධ සහිත වූවන්ගේ දිස්ත්‍රික් ක්‍රීඩා උළෙල, ප්‍රජා මූලික පුනරුත්තාපන වැඩසටහන හා අනෙකුත් ව්‍යාපෘතීන් සඳහා වියදම් කළ මුළු මුදල රුපියල් 990,793,500.00 කි.

17. 2024 වර්ෂයේ මුළු වැටලීම් සංඛ්‍යාව 1,340 ක් වන අතර පාරිභෝගික පැමිණිලි 88ක් වන අතර ක්‍රියා මාර්ග ගෙන අවසන් කරන ලද පැමිණිලි සංඛ්‍යාව 30කි. දඩ මුදල් අයවීම රුපියල් 10,137,000.00 ක් වන අතර නඩු පැවරීම් සංඛ්‍යාව 1,239 කි.

18. ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකය මගින් ග්‍රාමීය ප්‍රජාව, පාසල් සිසුන් හා රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම හා ආපදා කළමනාකරණ සැලසුම් සකස් කිරීම .

19. 1988 අංක 68 දරන පොහොර විධිමත් කිරීමේ පනත යටතේ පිහිටුවා ඇති ජාතික පොහොර ලේකම් කාර්යාලයේ අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාලය ලෙස කටයුතු කරමින් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණයෙන් පොහොර සම්බන්ධ කටයුතු නියාමනය කිරීම

20. සමථකරණය පිළිබඳ පුහුණු වැඩ සටහන් හා රාජ්‍ය නිලධාරීන් , ස්වේච්ඡා සංවිධාන , මූල්‍ය ආයතන මෙන්ම ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම.

21. දිස්ත්‍රික්කය තුල සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහාවූ සංචාරක ආකර්ශනයක් ඇති හා නොමැති ස්ථාන හඳුණාගැනීම හා දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම මෙන්ම සංචාර සේවා සපයන ආයතන හඳුනා ගැනීම හා එම ආයතන දත්ත පද්ධතියට ඇතුල් කිරීම හා පළාත් සංචාරක දෙපාර්තමේන්තුව එක්ව සංචාරක මාර්ගෝපදේශකයින් පුහුණු කිරීම හා බලපත්‍ර ලබාදීම හා සුළු හා මධ්‍ය පරිමාන ව්‍යවසායකින් සඳහා සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම උදෙසා විවිධ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

22. දිස්ත්‍රික් පුපුරණ දව්‍ය අවශ්‍යතාව වෙනුවෙන් අවසර පත්‍ර 144 ක් හා බලපත්‍ර 16 ක් පතරොම් 1,643 නිකුත් කිරීම

23. දිස්ත්‍රික්කයේ කුඩා ව්‍යාපාර සංවර්ධන සඳහා ප්‍රතිලාභීන් 8,437 දෙනකු සඳහා විවිධ ව්‍යාපෘති පැවැත්වූ අතර ඒ සඳහා වියදම රුපියල් 7,066,592.80 කි.

24. ව්‍යවසායක සංවර්ධනය සඳහා දිස්ත්‍රික්කය පුරා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම .

25. කාන්තාවන් ආර්ථික හා සමාජීය වශයෙන් සවිබල ගැන්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

26. ළමා ආරක්ෂාව, පූර්ව ළමාවිය සංවර්ධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

27. මනෝ උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

28. "අනුරාධපුර පුවත්" Facebook පිටුව හා "Rajarata News" You Tube නාලිකාව අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.

2.2 අභියෝග

I. **2024** ජාතික මැතිවරණ 2ක් පැවැත්වීම තුල මැතිවරණ නීති රීති වලට අනුගතව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සිදුවීම තුල විවිධ බාධක මතු වුවද, වැඩ සටහන් හා සම්බන්ධ වූ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සියලු නිලධාරීන්ගේ දැඩි කැපවීම හා උනන්දුව මත ඉලක්ක ගත අරමුණු කරා ලඟා වීමට හැකි වීම.

II. අත්‍යවශ්‍ය තනතුරුවලට අදාළව දිස්ත්‍රික්කයේ පවතින මානව සම්පත්වල හිඟතාවය.

2.3 ඉදිරි ඉලක්ක 2025

01. විමධ්‍යගත අයවැය -2025
02. අස්වැසුම් සුභසාධන ප්‍රතිලාභ ගෙවීම් කටයුතු
03. Clean Sri Lanka වැඩසටහන සඳහා දිස්ත්‍රික්කයේ දායකත්වය ලබාදීම.
04. කෘෂිකාර්මික අපනයන නිෂ්පාදන ව්‍යාපෘති බිහිකිරීම.
05. නොරතුරු තාක්ෂණය මූලික ඒ රාජ්‍ය සේවයක් සඳහා කටයුතු ප්‍රවර්ධනය
06. ඵලදායිතා සංකල්ප තුළින් රාජ්‍ය සේවය කාර්යක්ෂම කිරීම.
07. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සුළු පරිමාණ හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින් බිහි කිරීම.
08. ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් මත්ද්‍රව්‍ය වලට ගොදුරු වූ අය ඉන් මිදවා සමාජගත කිරීම.
09. ආගම සංස්කෘතිය මූලික සංස්කෘතික හර පද්ධතීන් සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
(ජනලැති පරියේෂණ මූලික සහරාවක් එළි දැක්වීම)
10. පෝෂණ අවශ්‍යතා ඇති අඩු ආදායම්ලාභී ගර්භණී මව්වරුන් දරු ප්‍රසූතිය සිදුවන තෙක් පෝෂණ මට්ටම පවත්වාගෙන යාම සඳහා වැඩපිළිවෙලක් යෑකිරීම.
11. පෝෂණ අවශ්‍යතා ඇති අඩු ආදායම්ලාභී දරුවන්ගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීම සඳහා කැපකරු ක්‍රමයට අනුගත කිරීම.
12. ජනමාධ්‍ය හා මාධ්‍ය නිවැරදිව භාවිතය හා වර්ණාකරණය පිළිබඳව මාධ්‍යවේදීන්ගේ ආකල්ප ඉහළ දැක්වීමේ වැඩසටහන් පැවැත්වීම.
13. පරිසර සංරක්ෂණයට දායක වන වගා ව්‍යාපෘති සිදු කිරීම. (නාගරික වන වගා ඇතුළුව)
14. සමාජ ආචාර ධර්ම හා හර පද්ධතීන් දිස්ත්‍රික්කය තුළ ප්‍රවර්ධනය.
15. පොලිතීන් භාවිතය අවම කිරීම හා අවිධිමත් කසළ බැහැර කිරීම අවම කිරීම, විද්‍යුත් අපද්‍රව්‍ය පරිසරයට එකතු කිරීම වැලැක්වීම සඳහා අවශ්‍ය දැනුවත් කිරීම සඳහා සක්‍රිය මැදිහත්කරුවෙකු වීම හා පරිසර හිතකාමී නිෂ්පාදන දිස්ත්‍රික්කය තුළ ප්‍රවර්ධනය.
16. දිස්ත්‍රික්කයේ ක්‍රියාකාරී රාජ්‍ය නොවන සංවිධානයකින් ව්‍යාපෘති දෙක බැගින් සිදු කිරීම.
17. අල්ලස හා දූෂණය පිටු දැකීමට නිලධාරී හා සමාජ දැනුවත්භාවය ඇතිකිරීම.

ඊ.එම්.සී.හේරත්
ප්‍රධාන ගණකාධිකාරී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
අනුරාධපුර

ඊ.එම්.සී. හේරත්
ප්‍රධාන ගණකාධිකාරී (වැ.ඔ.)
අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

කේ.ජී.ආර්.ඒමලතුංග
දිසාපති/දිස්ත්‍රික් ලේකම්
අනුරාධපුර

කේ.ජී.ආර්. ඒමලතුංග
දිසාපති/දිස්ත්‍රික් ලේකම්
අනුරාධපුර.

CamScanner

13

03 පරිච්ඡේදය

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යය සාධනය

3.1 මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශය

ඒසිජ්-එෆ්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය- අනුරාධපුර.

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024 රු.		සටහන	කෘත්‍ය 2024 රු.	2023 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසිජ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අයිම		7,033,644,000	7,184,379,500	ඒසිජ-3
-	කැන්පතු		1,680,333,628	971,320,017	ඒසිජ-4
81,000,000	අත්තිකාරම් ගිණුම්		123,725,971	84,520,607	ඒසිජ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
81,000,000	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		8,837,703,599	8,240,220,124	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		8,837,703,599	8,240,220,124	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		10,261,169	146,278,606	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		8,827,442,429	8,093,941,518	
	අඩු කළා : වියදම්				
-	ප්‍රතිසංවිධාන වියදම්		-	-	
1,882,440,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	1,831,054,333	1,144,480,885	
241,200,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	216,890,318	180,390,414	ඒසිජ-2(ii)
589,331,456	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	587,377,525	1,271,366,888	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් ප්‍රතිසංවිධාන වියදම්	9	-	-	
2,712,971,456	මුළු ප්‍රතිසංවිධාන වියදම් (ඒ)		2,635,322,176	2,596,238,186	
	මූලධන වියදම්				
	මූලධන වත්කම් ප්‍රතිස්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	63,541,872	34,125,727	
65,200,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	23,716,635	80,825,636	
24,400,000	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසිජ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
-	භැකියා වර්ධනය	14	2,625,639	289,300	
3,400,000	වෙනත් මූලධන වියදම්	15	-	98,608,220	
-	මුළු මූලධන වියදම් (උ)		89,884,146	213,848,883	
93,000,000			1		

4.

	තැන්පතු ගෙවීම	1,648,869,676	945,758,380	ඒසිඒ-4
110,000,000	අත්තිකාරම් ගෙවීම	217,788,021	82,591,206	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම	-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)	1,866,657,697	1,028,349,586	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)	4,591,864,019	3,838,436,656	
	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)	4,235,578,410	4,255,504,862	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය	4,224,673,115	4,252,557,009	ඒසිඒ-7
	2023 අග්‍රිම ගිණුම් පියවීම	(2,947,853)		
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය	13,853,148	2,947,853	ඒසිඒ-3
		4,235,578,410	4,255,504,862	

4.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2024 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අනුරාධපුර

	සටහන	2024 රු.	2023 රු.
මූලික නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිස්-6	4,376,047,241	4,332,245,072
මූලික වත්කම්			
තත්කාරම් ශිෂ්‍යම්	ඒසිස්-5/5(ඒ)	324,376,921	230,314,870
සිදුවී ඇ සිදුවී නමුත් දැ	ඒසිස්-3	13,853,148	2,947,853
මුළු වත්කම්		4,714,277,310	4,565,507,795
සුද්ධ වත්කම් / ස්වාමිත්වය			
ආයෝජනාරය වෙත ශුද්ධ වත්කම්		127,963,220	65,365,121
දේපළ පිරියත හා උපකරණ සංරක්ෂණ		4,376,047,241	4,332,245,072
කුලී හා වැඩ පෙන්වාගෙන් සංරක්ෂණ	ඒසිස්-5(ඒ)		
සංකල්ප වගකීම්			
තැන්පතු ශිෂ්‍යම්	ඒසිස්-4	196,413,701	164,949,749
අනුමත වගකීම	ඒසිස්-3	13,853,148	2,947,853
මුළු වගකීම්		4,714,277,310	4,565,507,795

මියූ අංක 1 සිට 36 දක්වා ඒසිස් 1 සිට ඒසිස් 7 දක්වා යූ ආයෝජ සහවලින් ඉදිරියෙන් සඳහන්ව ඇති ශිෂ්‍යම් පොරොත්තු සහ ගැළපුම් මියූ අංක 37 සිට 77 දක්වා ඇතුළත් ශිෂ්‍යම් සටහන් විස්තර ද මෙම ඉදිරියන් ශිෂ්‍යමෙම්ම අත්‍යවශ්‍යය කොටස් වේ. මෙම මූලික ප්‍රකාශන පිළිගෙයල ඇති ලේඛන 150 සහ 151 සහ 2024.12.16 දිනැති වාසිය ශිෂ්‍යම් සංවර්ධනයේදීම අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුම්කරණ සඳහාගේ සංවිත, නීති දේපළ ශිෂ්‍යම් සටහන් හා අංගෝපාංග ශිෂ්‍යම් පොරොත්තු හා ස්වාමිත්වයෙන් ශිෂ්‍යම් පසාන් සකින සැසඳීම් තර ඇති වෙවටත් ඒවා එම සංවිත සකින එකින වන වීවටත් අවශ්‍ය කරමු.

මූලික කොන්තාස සඳහා වලදාම් අත්සන්කර කලාප පද්ධතියක් විවිධකාරණ කාර්යාලය තුළ පවතින බවත් මූලික කලාපය පදනම අත්සන්කර කලාප පද්ධතියේ සරලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති වලදාම් කලාප ක්‍රියාත්මක කිරීමට අධ්‍යාය පවදී මණ්ඩල් කිරීමේ වැඩිමනම වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණකාදිකම් නිලධාරි
එස්.අලෝකමණ්ඩාර්
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය
දිනය.....

ගණකාදිකම් නිලධාරි
කේ.ඒ.ආර්.ජිවලසූරිය
දිසාපති/දිස්ත්‍රික් ලේකම්
අනුරාධපුර.
දිනය 2025.04.09

ප්‍රධාන මූල්‍ය නිලධාරිත්වය ගණකාධිකාරි
අධ්‍යක්ෂ (මූල්‍ය)/ කොන්ත්‍රාත්තර (මූල්‍ය)
ඩී.එම්.සී.ගෙන්රත්
ප්‍රධාන ගණකාධිකාරි (බැ බ.)
දිස්ත්‍රික් ලේකම් කාර්යාල- අනුරාධපුර.
දිනය 2025.04.18

ඩී.එම්.සී. හේරත්
ප්‍රධාන ගණකාධිකාරි (වැ බ.)
අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

CamScanner

4.2 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-සී

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අනුරාධපුර.

	2024 රු.	2023 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	305,001,458	500,929,723
අග්‍රිම ලැබීම්	7,033,644,000	7,184,379,500
අත්තිකාරම් අයකර ගැනීම්	125,170,865	122,843,043
තැන්පතු ලැබීම්	1,680,333,628	971,320,467
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	9,144,149,952	8,779,472,733
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	2,038,106,776	1,315,912,754
සහනාධාර සහ මාරුකිරීම්	587,377,525	1,271,366,888
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	4,640,380,208	4,748,652,438
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	10,261,169	146,278,606
අත්තිකාරම් ගෙවීම්	118,464,325	137,225,204
තැන්පතු ගෙවීම්	1,648,869,676	946,350,455
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	9,043,459,681	8,565,786,345
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	100,690,271	213,686,387
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භූමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	99,170	162,496
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	99,170	162,496
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන වියදම්	89,884,146	213,848,883
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	89,884,146	213,848,883
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	(89,784,976)	(213,686,387)

මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	10,905,295	0
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		-
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	10,905,295	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	2,947,853	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	13,853,148	-

4.3 මූල්‍ය ප්‍රකාශ සටහන් -

සටහන් නොමැත

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. ‘000

ආදයම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
1003.07.99	බලපත්‍ර ගාස්තු හා අනෙකුත්	8,000	8,000	10,614	132
2002.02.99	පොලිය හා අනෙකුත්	13,200	13,200	14,280	108
2003.02.99	විකුණුම් ගාස්තු හා පරිපාලන ගාස්තු	5,500	8,400	7,615	90
2002.01.01	නිල නිවාස සංචාරක බංගලා හා නිවාඩු නිකේතන	10,700	10,700	10,107	94
එකතුව		37,400	40,300	42,616	105

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය(274 - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය)

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
(1) පුනරාවර්තන	1,640,000,000.00	2,712,971,456.00	2,635,322,176.44	97%
(2) ප්‍රාග්ධන	65,000,000.00	93,000,000.00	89,884,145.89	97%
එකතුව	2,005,000,000.00	2,805,971,456.00	2,725,200,322.33	97%

3.7 **මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන**

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබාදුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස
			මුල් ප්‍රතිපාන	අවසන් ප්‍රතිපාදන		
1	ජනාධිපති කාර්යාලය (001)	පුනරාවර්ථන	-	816,060.00	671,460.00	82
		ප්‍රාග්ධන	-	1,569,374,395.15	1,311,327,835.77	84
2	මැතිවරණ කොමිෂන් සභාව(020)	පුනරාවර්ථන	-	6,035,475.58	6,035,475.58	100
3	බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය (101)	පුනරාවර්ථන	-	142,924.70	127,415.70	89
		ප්‍රාග්ධන	-	15,786,318.00	15,249,861.23	97
4	මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය 102	පුනරාවර්ථන	-	1,847,547,599.00	1,802,171,080.30	98
5	ආරක්ෂක අමාත්‍යාංශය (103)	පුනරාවර්ථන	-	26,244,298.03	24,678,505.89	94
		ප්‍රාග්ධන	-	20,067,303.77	19,817,061.56	99
6	අධිකරණ අමාත්‍යාංශය (110)	පුනරාවර්ථන	-	14,893,840.00	12,355,151.27	83
		ප්‍රාග්ධන	-	4,786,190.00	4,631,946.82	97
7	සෞඛ්‍ය අමාත්‍යාංශය 111	පුනරාවර්ථන	-	49,820,607.00	37,673,954.37	76
		ප්‍රාග්ධන	-	347,600.00	332,459.85	96
8	ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය (117)	ප්‍රාග්ධන	-	47,885,428.00	23,986,448.39	50
9	කෘෂිකර්ම අමාත්‍යාංශය (118)	පුනරාවර්ථන	-	33,441,622.25	30,962,699.88	93
		ප්‍රාග්ධන	-	20,623,523.50	13,165,634.07	64
10	ඉඩම් අමාත්‍යාංශය (122)	පුනරාවර්ථන	-	3,538,120.53	3,530,851.82	100
		ප්‍රාග්ධන	-	130,506,709.77	130,193,769.78	100
11	කර්මාන්ත අමාත්‍යාංශය (126)	පුනරාවර්ථන	-	1,005,900.00	840,943.75	84
		ප්‍රාග්ධන	-	4,710,000.00	4,652,025.32	99
12	රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය (130)	පුනරාවර්ථන	-	100,354,012.25	95,582,253.22	95
		ප්‍රාග්ධන	-	8,221,834.84	7,806,474.40	95
13	කර්මාන්ත අමාත්‍යාංශය (149)	පුනරාවර්ථන	-	3,394,283.01	3,122,068.08	92
		ප්‍රාග්ධන	-	123,100.00	121,100.00	98
14	පරිසර අමාත්‍යාංශය (160)	පුනරාවර්ථන	-	6,057,671.70	6,057,671.70	100
		ප්‍රාග්ධන	-	220,000.00	203,617.50	93

15	කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය (171)	පුනරාවර්ථන	-	474,932,711.44	465,192,360.20	98
		ප්‍රාග්ධන	-	4,229,715.78	2,939,494.68	69
16	ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය (187)	පුනරාවර්ථන	-	4,159,144.90	3,575,968.91	86
17	මහජන ආරක්ෂක අමාත්‍යාංශය(189)	පුනරාවර්ථන	-	616,565.00	568,242.05	92
18	ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය (193)	පුනරාවර්ථන	-	2,722,915.00	2,579,666.41	95
		ප්‍රාග්ධන	-	375,550.00	373,760.00	100
19	ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය (194)	පුනරාවර්ථන	-	3,140,264.56	2,615,428.51	83
		ප්‍රාග්ධන	-	27,016,351.88	24,007,793.95	89
20	වාරිමාර්ග අමාත්‍යාංශය(198)	පුනරාවර්ථන	-	11,276,498.35	9,469,108.89	84
		ප්‍රාග්ධන	-	5,288,312.86	5,006,628.41	95
21	බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව (201)	පුනරාවර්ථන	-	31,827,571.25	31,670,333.27	100
		ප්‍රාග්ධන	-	8,384,865.75	8,137,981.22	97
22	මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව (202)	පුනරාවර්ථන	-	5,000.00	4,289.00	86
		ප්‍රාග්ධන	-	411,764.00	405,169.88	98
23	සංස්කෘතික කටයුතු දෙපාර්තමේනතුව (206)	පුනරාවර්ථන	-	5,320,500.00	5,229,750.01	98
		ප්‍රාග්ධන	-	161,000.00	140,000.00	87
24	රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව(210)	පුනරාවර්ථන	-	108,700.00	106,648.33	98
		ප්‍රාග්ධන	-	35,500.00	35,500.00	100
25	සමාජ සේවා දෙපාර්තමේන්තුව (216)	පුනරාවර්ථන	-	32,128,690.56	30,209,696.40	94
		ප්‍රාග්ධන	-	1,212,250.00	1,212,250.00	100
26	පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව (217)	පුනරාවර්ථන	-	652,500.00	607,406.66	93
		ප්‍රාග්ධන	-	2,784,500.00	2,741,740.00	98
27	ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව (219)	පුනරාවර්ථන	-	184,548.48	105,744.12	57
28	ආයුර්වේද දෙපාර්තමේන්තුව (220)	පුනරාවර්ථන	-	174,342,891.45	172,891,891.18	99
		ප්‍රාග්ධන	-	845,640.00	777,957.00	92
29	ආගමන හා විගමන දෙපාර්තමේන්තුව(226)	පුනරාවර්ථන	-	21,300.00	21,300.00	100
30	පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව(227)	පුනරාවර්ථන	-	31,809,710.99	31,740,419.52	100
31	සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව (243)	පුනරාවර්ථන	-	4,998,000.00	4,998,000.00	100
32	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව(246)	පුනරාවර්ථන	-	1,330,463.36	1,288,300.70	97
33	ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව (248)	පුනරාවර්ථන	-	250,044.91	217,430.36	87
		ප්‍රාග්ධන	-	443,906.00	393,416.22	89
34	ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව(252)	පුනරාවර්ථන	-	2,482,256.63	2,332,981.29	94
		ප්‍රාග්ධන	-	46,636,342.84	42,579,632.68	91

35	රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තු (254)	පුනරාවර්ථන	-	22,532.40	17,450.00	77
		ප්‍රාග්ධන	-	492,318.40	483,527.00	98
36	රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව (282)	ප්‍රාග්ධන	-	2,300,000.00	2,294,100.00	100
37	වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව (284)	පුනරාවර්ථන	-	54,406,350.00	53,913,766.60	99
38	ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව(286)	පුනරාවර්ථන	-	62,465,458.00	52,095,849.32	83
		ප්‍රාග්ධන	-	376,270.00	376,253.34	100
39	සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව (292)	ප්‍රාග්ධන	-	2,000,000.00	1,997,966.00	100
40	ජේෂ්ඨ කර්මාන්ත දෙපාර්තමේන්තුව(303)	පුනරාවර්ථන	-	516,000.00	516,000.00	100
41	කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව (304)	ප්‍රාග්ධන	-	250,000.00	249,687.50	100
42	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව (307)	පුනරාවර්ථන	-	6,921,100.00	6,182,416.68	89
		ප්‍රාග්ධන	-	14,884,843.39	13,405,896.69	90
43	ප්‍රජාපාදක විශෝධන දෙපාර්තමේන්තුව (326)	පුනරාවර්ථන	-	1,156,170.00	1,042,149.50	90
44	ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැළසුම් දෙපාර්තමේන්තුව (327)	පුනරාවර්ථන	-	708,104.00	691,854.76	98
		ප්‍රාග්ධන	-	2,322,000.00	2,190,968.79	94
45	මිනිස්බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුව (328)	පුනරාවර්ථන	-	1,062,500.00	958,453.53	90
		ප්‍රාග්ධන	-	605,407.80	580,762.50	96
එකතුව				**4,946,569,847.06**	**4,546,471,158.31**	**92**

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	2024.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2024.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණ -යට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	1,022,271,217.14	1,022,271,217.14	-	100%
9152	යන්ත්‍රෝපකරණ	557,618,702.67	557,618,702.67	-	100%
9153	ඉඩම්	2,376,103,486.37	2,376,103,486.37	-	100%
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	420,036,384.75	420,036,384.75	-	100%
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. NCCG/AN/A1/DSFS/2025/11

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2025 මැයි 30 දින.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අනුරාධපුර
ලැබුණු දිනය 03 JUN 2025
අංකය N 2517

දිස්ත්‍රික් ලේකම්,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
අනුරාධපුර.

ශීර්ෂය 274 - අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 274 - අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි මස 30 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල යටහත් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මාගේ වාර්තාව අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මාගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම් හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී.

වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය නොවන වත්කම්

(අ) 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දේපල, පිරියත හා උපකරණ ගණයට අයත් වත්කම් වර්ග 02 ක පෙර වර්ෂයේ අවසන් ශේෂය හා සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය අතර, රු.21,933,616 ක වෙනසක් පැවතුණි.

(ආ) 2018 වර්ෂයේදී ස්ථාපිත කළ රු.2,405,200 ක වටිනාකමින් යුත් සූර්යය විදුලි බල පද්ධති 02 ක් සමාලෝචිත වර්ෂයේදී ද, ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දේපල, පිරියත හා උපකරණ එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විට අදාල වැඩ අවසන් කර ඇති රු.420,006,360 ක් වූ දේපල, පිරියත හා උපකරණ ලෙජර් ගිණුම් අංක 9160 හි වටිනාකම් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර නොතිබුණි.

1.6.2 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම

සමාලෝචිත වර්ෂයේදී දේපල, පිරියත උපකරණ සඳහා (9152 කේතයට අදාලව) රු.32,536,300 ක් ගැලපීම් කර තිබුණු අතර එම ගැලපීම් සඳහා ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) විගණනය වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පහත සඳහන් විගණන නිරීක්ෂණය අනුව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ අනුරූපී වී නොතිබුණි.

විගණන නිරීක්ෂණය	මෙම වාර්තාවේ ඡේදයට යොමුව
සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පිළියෙල කර තිබුණු මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ මූල්‍ය නොවන වත්කම් යටතේ හෙළිදරව් කර තිබුණු දේපල පිරියත හා උපකරණ ගණයට අයත් වත්කම් වර්ග 02 ක පෙර වර්ෂයේ අවසන් ශේෂය හා සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය අතර, රු.21,933,616 ක වෙනසක් විය.	1.6.1(අ)

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාවේ 3.5(xi) ඡේදය	2018 වර්ෂයේදී ස්ථාපිත කළ රු.2,405,200 ක් වටිනාකමින් යුත් සූර්යය විදුලි බල පද්ධති 02 ක් ගිණුම්ගත නොකිරීමේ වරද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් නිවැරදි කර නොතිබීම.	1.6.1(ආ)

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

3.1.1 වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දුර්වලතා

මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණව නිවැරදිව පිළියෙල කළ යුතු වුවත්, වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දුර්වලතා විය.

(අ) වැය විෂයයන් 08 ක එකතුව රු.මිලියන 618.7 ක් වූ මූලික ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් එකතුව රු.මිලියන 225.24 ක් එනම්, සියයට 30 සිට සියයට 82.5 ක දක්වා වූ ප්‍රමාණයකින් ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන් සඳහා මාරු කිරීම් කර තිබුණි.

(ආ) වැය විෂයයන් 09 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.මිලියන 23.75 කින් රු.මිලියන 10.49 ක ප්‍රතිපාදන උපයෝජනය නොකර, එනම් සියයට 31.5 සිට සියයට 62.6 දක්වා ප්‍රමාණයකින් ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

3.1.2 ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම

තඹුත්තේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉදිකිරීම් ව්‍යාපෘති 03 ක් සඳහා සමාලෝචිත වර්ෂය තුළ වෙන්කරන ලද එකතුව රු.4,761,500 ක් වූ මුළු ප්‍රතිපාදන මුදලම උපයෝජනය කර නොතිබුණි.

3.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරි/ගණන්දීමේ නිලධාරි විසින් සිදු කළ යුතු සහතිකවීම්

අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි හා ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති රීති රෙගුලාසි වලට යොමුව		වටිනාකම (රු.)	අනුකූල නොවීම
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය		
(i)	මුදල් රෙගුලාසි 137 හා 138	376,527	ගෙවීම් අනුමත කිරීම හා සහතික කිරීමකින් තොරව තඹුත්තේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසය තුළ වවුචර් 06 ක් සඳහා ගෙවීම් කර තිබුණි.
(ii)	මුදල් රෙගුලාසි 237 (ආ)	563,400	භාණ්ඩ ලැබී ඇති බවට හා එම භාණ්ඩ තොග ලේඛන වලට ඇතුළත් කර ඇති බවට සහතිකයක් වවුචරයට අමුණා තැබිය යුතු වුවත්, තලාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මිලදී ගන්නා ලද, වායු සම්කරණ යන්ත්‍ර වෙනුවෙන් 2024 දෙසැම්බර් 20 දින අංක 589068 දරන චෙක්පත මඟින් ගෙවීම් සිදු කිරීමේදී අදාළ භාණ්ඩ ලැබී ඇති බවට නඟපුරැ කර ගැනීමෙන් තොරව ගෙවීම් සහනික කර තිබුණි.

(ආ) අමාත්‍යාංශ චක්‍රලේඛ

(i) අංක 30/2016 හා 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය

3.1 වගන්තිය	-	රාජ්‍ය ආයතන සතු වාහනවලට අදාළව මාස 12 කට වරක් හෝ එන්ජිමේ අලුත්වැඩියාවකට පසු හෝ ධාවනය කර ඇති දුර කිලෝ මීටර් 50000 ඉක්මවා යන අවස්ථා 03 න් පළමු අවස්ථාවට පසුව ඉන්ධන දැවීම පිළිබඳ පරීක්ෂා කළ යුතු වුවද, පලුගස්වැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු අංක PD – 1837 දරන කැබරථය 2018 දෙසැම්බර් 10 දිනෙන් පසු ඉන්ධන දහනයවීම පිලිබඳ පරීක්ෂා කර නොතිබුණි.

(ii) අංක 9/2009 හා 2009 අප්‍රේල් 16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය

iv උප වගන්තිය	689,647	වේලාව පදනම් කර ගනිමින් අතිකාල දීමනා හා නිවාඩු දින වැටුප් ආදී රාජකාරී වේලාවෙන් පසුව කරනු ලබන රාජකාරී සඳහා දීමනා ගෙවීමේ දී එම කාලය, ඇඟිලි සලකුණු යන්ත්‍ර වාර්තා මඟින් සනාථ කර ගත යුතු වුවත්, එලෙස සනාථ කර ගැනීමකින් තොරව තලාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවයේ නියුතු නිලධාරීන් 08 දෙනෙකුට සමාලෝචිත වර්ෂයේදී දීමනා ගෙවා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006 භාණ්ඩ සහ වැඩ

අත්පොතෙහි 6.3.6	-	ලංසු විවෘත කිරීම පිළිබඳ කටයුතු නියමිත ආකෘති පත්‍රයක වාර්තා ගත කළයුතු වුවත්, පලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලංසු විවෘත කිරීම සම්බන්ධව ඒ අනුව වාර්තා කබාගෙන නොතිබුණි.

3.4 බදු අවශ්‍යතාවන්ට අනුකූල නොවීම

නොවිවියාගම, ගලෙන්බිදුණුවැව, තඹුත්තේගම සහ මහ විලව්විලය ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල බද්දට යටත් වන නිලධාරීන්ගේ සේවා නියුක්ති ආදායමින් ගෙවිය යුතු අත්තිකාරම් පුද්ගල ආදායම් බදු ගණනය

කිරීමෙදි (APIT Tax) වැඩ බැලීමේ දීමනා, පෞද්ගලික පරිහරණය සඳහා භාවිතයට ගන්නා රජයේ වාහන, විවිධ දීමනා සහ නිල නිවාස දීමනා ආදිය බදු ගණනය කිරීම සඳහා ආදායම් ලෙස සැලකිල්ලට ගෙන නොතිබුණි.

3.5 තැන්පතු

හොරොව්පොතාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පොදු තැන්පත් ගිණුමේ අවුරුදු 01 යි මාස 06 ක් හා අවුරුදු 02 ත් අතර කාලපරිච්ඡේදයක පවතින එකතුව රු.268,593 ක් වූ තැන්පතු 09 ක් සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග නොගෙන රඳවාගෙන තිබුණි.

3.6 බැංකු ගිණුම් මෙහෙයවීම

තඹුත්තේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් මස ලියන ලද එකතුව රු.376,503 ක් වූ චෙක්පත් 06 ක හා මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ලියන ලද රු.2,871,555 ක චෙක්පතක් වලංගු දින 30 ක කාලය ඉක්මවා තිබුණ ද, ආදායකයන් වෙත නිකුත් නොකර රඳවාගෙන තිබුණි. ආදායකයකට නිකුත් නොකළ චෙක්පත් බැංකු සැසඳුම් ප්‍රකාශවල ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් ලෙස පෙන්වා තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 දේශීය අරමුදල් යෙදවූ ව්‍යාපෘති

(අ) නැගෙනහිර නුවරගම පළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය බල ප්‍රදේශයේ ශ්‍රී විමලධර්මදූත විහාරයේ සංඝාවාස ගොඩනැගිල්ල පිළිසකර කිරීමේ ව්‍යාපෘතිය සඳහා ගෙවීම් කිරීමේදී නියමිත ගුණාත්මකභාවයෙන් ඉටුනොකළ ඇස්තමේන්තුවේ වැඩ විෂය අංක 1.1 වෙනුවෙන් රු. 432,136 ක් ද, ඉටු නොකරන ලද ඇස්තමේන්තුවේ වැඩ විෂය අංක 1.3 වෙනුවෙන් රු. 107,160 ක් ද, ගෙවා තිබුණි.

(ආ) කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රැස්වීම් ශාලාව අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය සඳහා ගෙවීම් කිරීමේදී ඇස්තමේන්තුවේ වැඩ විෂය අංක 4.5 සඳහා රු.12,120 ක් වැඩිපුර ගෙවා තිබුණු අතර, නියමිත පිරිවිතරවලින් බැහැරව ඉටුකර තිබුණු ඇස්තමේන්තුවේ වැඩ විෂය අංක 2.1 සඳහා රු.103,170 ක් ද, අතිරේක වැඩ විෂය අංක 1.1 සඳහා රු.236,657 ක් ද, වශයෙන් එකතුව රු.339,827 ක් ගෙවා තිබුණි.

(ඇ) කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ වවනියාව ප්‍රධාන මාර්ගයේ සිට ප්‍රාථමික පාසල දක්වා මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා ගෙවීම් කිරීමේදී නියමිත ගුණාත්මක මට්ටමකින් ඉටු කර නොතිබුණු ඇස්තමේන්තුවේ වැඩ විෂය අංක 04 සඳහා රු.162,372 ක් ගෙවීම් කර තිබුණු අතර, ඇස්තමේන්තුවේ වැඩ විෂය අංක 03 සඳහා රු.31,478 ක් ද, වැඩ විෂය අංක 04 සඳහා රු.7,494 ක් ද, වශයෙන් එකතුව රු. 38,972 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඈ) කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ තල්ගහවැව හන්දියේ සිට නිකවැව හන්දිය දක්වා මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ගෙවීම් කිරීමේදී වැඩ විෂය අංක 03 හා 04 සඳහා රු.168,399 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඉ) මධ්‍යම නුවරගම පළාත ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ අනුර මහතාගේ නිවස අසල සිට තන්නායම්කුලම මාර්ගය බොරළු දමා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා ගෙවීම් කිරීමේදී

ඇස්තමේන්තුවේ වැඩ විෂය අංක 1.5 හා 1.6 සඳහා පිළිවෙලින් රු.353,968 ක් හා රු.115,748 ක් ලෙස එකතුව රු.469,716 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඊ) මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශයේ තෙප්පන්කුලම ධර්ම බෝධි විහාර මාවත බොරළු දමා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා ගෙවීම් කිරීමේදී ඇස්තමේන්තුවේ වැඩ විෂය අංක 1.4 හා 1.5 සඳහා පිළිවෙලින් රු.686,648 ක් හා රු.224,536 ක් වශයෙන් එකතුව රු.911,184 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(උ) මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශයේ ඇළ කන්ද පාර චාරිමාර්ග ඇල පාර බොක්කු 02 ක් හා බොරළු දමා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා ගෙවීම් කිරීමේදී ඇස්තමේන්තුවේ වැඩ විෂය අංක 1.5 හා 1.6 සඳහා පිළිවෙලින් රු.180,773 ක් හා රු.59,113 ක් වශයෙන් එකතුව රු.239,886 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඌ) මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශයේ තෙප්පන්කුලම නිවාස 20 මාර්ගය බොරළු දමා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා ගෙවීම් කිරීමේදී ඇස්තමේන්තුවේ වැඩ විෂය අංක 1.5 හා 1.6 සඳහා පිළිවෙලින් රු.557,022 ක් හා රු.182,148 ක් වශයෙන් එකතුව රු.739,170 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(එ) හොරොව්පොතාන ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශයේ නිකවැව මුස්ලිම් විදුහලේ මහල් දෙකකින් යුත් පන්ති කාමර ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ සිදුකිරීම සඳහා ගෙවීම් කිරීමේදී ඇස්තමේන්තුවේ වැඩ විෂය අංක 5.1 , 5.2 හා 1.2 සඳහා පිළිවෙලින් රු.100,688 ක්, රු.1,102 ක් හා රු.9,247 ක් ද, වශයෙන් එකතුව රු.111,037 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඒ) හොරොව්පොතාන ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශයේ වීරසෝලේ මුස්ලිම් විදුහලේ අඩි 90 x 25 ප්‍රමාණයේ ගොඩනැඟිල්ලේ ඉතිරි වැඩ නිම කිරීම සඳහා ගෙවීම් කිරීමේදී අතිරේක වැඩ විෂය අංක 01 සඳහා රු.446,994 ක් වැඩිපුර ගෙවා තිබුණි.

4.2 ප්‍රසම්පාදනයන්

(අ) මැදවච්චිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන තීරණ අංක 2024/25 ට අනුව ඡායා පිටපත් යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා ලැබී තිබුණු අවම මිල ප්‍රතික්ෂේප කර රු.80,000 ක් වැඩිපුර ගෙවා මිලදී ගැනීම සිදුකර තිබුණි.

(ආ) 2024 වර්ෂයේ ජනවාරි මස සිට 2024 සැප්තැම්බර් මස 30 දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළ කැකිරාව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් රු.6,522,501 ක් වූ මිලදී ගැනීම් සිදුකර තිබුණු නමුත් 2024 වර්ෂය සඳහා වර්ෂය ආරම්භයේ ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

4.3 වත්කම් කළමනාකරණය

(අ) පලාගල ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශයේ රාජ්‍ය ආයතන සතුව පැවති ගොඩනැගිලි සහිත ඉඩම් හෙක්ටයාර 4.89 ක් හා එම බල ප්‍රදේශයේ වසම් 07කට අයත් සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීමට ශාක්‍යතාවයක් පැවති ඉඩම් හෙක්ටයාර 289.49 ක් ඌන උපයෝජිතව පැවති අතර, එම ඉඩම් සහ ගොඩනැගිලි භුදුනාගෙන කාර්යක්ෂම හා ඵලදායීව යෙදවීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.

(ආ) පලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් වැව් රක්ෂිතය තුළ සිදුවන අනවසර භාවිතයන්, ඇල/ඔය ප්‍රදේශවල සිදුවන අනවසර භාවිතයන් හා පරිසරයට හානි වන ලෙස බොරළු කැණීම් ලෙස එකතුව හෙක්ටයාර 723.79 ක අනවසර භාවිතයන් පැවති නමුත් ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කිරීමට අවධානය යොමු වී නොතිබුණි.

(ඇ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක් සතු වත්කම් අයිතම් 185 ක් මාස 03 ත් වසර 10 ත් අතර කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි.

4.4 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශ වනිතා සංවර්ධන නිලධාරී ලෙස සේවය කළ නිලධාරිණියක් විසින් 2017 වර්ෂයේ සිදුකරන ලද රු.90,000 ක මූල්‍ය වංචාවක් තුළින් රජයට සිදුව තිබුණු අලාභය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.5 පාඩු හා හානි

නාච්චාදුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අංක 252 – 9881 දරන කැබ රථය 2015 මාර්තු 13 දින සිදුවූ අනතුර හේතුවෙන් රජයට අයවිය යුතු රු.242,270 ක මුදල අදාල පාර්ශවකරු ගෙන් අයකර ගැනීම සඳහා 2017 වර්ෂයේ නියෝග ලැබී තිබුණද, එකී අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.6 කළමනාකරණ දුර්වලතා

(අ) ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ 11 කට අයත් ග්‍රාම නිලධාරී වසම් 119 ක අවසන් වරට ඉඩම් කච්චේරි පවත්වා සමාලෝචිත වර්ෂයේ අවසන් වන විට වසර 02 කට අධික කාලයක් ගත වී තිබුණද, නියමානුකූල නොවූ ඉඩම් වෙනුවෙන් බලපත්‍ර ලබා ගැනීමට උනන්දුවන පිරිස් වලට ඉඩමේ අයිතිය තහවුරු කර ගැනීම සඳහා ඉඩම් කච්චේරි පැවැත්වීමට කටයුතු කර නොතිබුණු අතර, මේ හේතුවෙන් මෙම කාලසීමාව තුළ එම වසම්වලින් ඉදිරිපත්ව තිබුණු ඉඩම් කච්චේරි පැවැත්වීමට අදාල මූලික ආකෘතිපත්‍ර 5,737 ක් සම්බන්ධයෙන් කටයුතු කිරීමට නොහැකි වී තිබුණි.

(ආ) ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ 09 ක ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ගොවි පන්තියේ පුද්ගලයන්ට බලපත්‍ර සකස් කිරීම සඳහා ග්‍රාම නිලධාරී වසම් 115 කට අදාලව පළාත් ඉඩම් කොමසාරිස් විසින් අවසන් තේරීම් ලැයිස්තුව අනුමත කර, ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත එවා තිබු, ඉ.කොා. 144(ඒ) ආකෘති පත්‍ර 920 ක ප්‍රමාණයක් සඳහා සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විට වසරකට වඩා වැඩි කාලයක් ගත වී තිබුණද, අදාල බලපත්‍ර සකස් කර නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ 12 ක ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ගැනුම් මිලට බලපත්‍ර සකස් කිරීම සඳහා පළාත් ඉඩම් කොමසාරිස් විසින් අවසන් තේරීම් ලැයිස්තුව අනුමත කර, එවා තිබූ ඉ.කොා 144(ඒ) ආකෘති පත්‍ර 1968 ක ප්‍රමාණයක් සඳහා සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විට වසරකට වඩා වැඩි කාලයක් ගතවී තිබුණද, ගැනුම් මිලට බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු නොකර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල රඳවා ගෙන තිබුණි. එසේම බලපත්‍ර නිකුත් නොකිරීම නිසා දළ තක්සේරුව මත අයවිය යුතු ආදායමක් අයකර ගැනීමට ද නොහැකි වී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 12 ක රු.311,642,207 ක හිඟ බදු අයවිය යුතුව පැවතිණි.

(ඉ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 කට අදාලව සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විට විධිමත් අනුමැතිය ලැබී මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබුණු ලිපිගොනු 297 ක් හා තක්සේරු

දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබුණු ලිපිගොනු 97 කට අදාලව දළ තක්සේරුව මත බදු මුදල් අය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ 05 කට අදාලව පළාත් ඉඩම් කොමසාරිස් විසින් දීර්ඝකාලීන බදු පදනම් මත බලපත්‍ර නිකුත් කිරීමට අනුමැතිය ලබාදී තිබුණු ලිපිගොනු 255 ක ප්‍රමාණයක් සඳහා ඉඩම් නිලධාරීන් වෙත දළ අනු රේඛන සකස් කිරීම සඳහා ලබාදී වසර 01 ත් වසර 06 ත් අතර කාලපරිච්ඡේදයක් ගත වී තිබුණද දළ අනුරේඛන සකස් කර ඉදිරිපත් කර නොතිබුණි. ඒ හේතුවෙන් දීර්ඝකාලීන බදු බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලිය ප්‍රමාද වී තිබුණි.

(උ) පළාත් ඉඩම් කොමසාරිස් විසින් දීර්ඝකාලීන බදු පදනම් මත බලපත්‍ර නිකුත් කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ 04 කට අදාලව අයදුම්පත් 509 ක ප්‍රමාණයකට අනුමැතිය ලබාදී තිබුණද, සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විට අදාල අනුමැතිය ලැබී වසර 01 ත් වසර 17 ත් අතර කාලපරිච්ඡේදයක් ගත වී තිබුණද, බදුකරුවන් විසින් මුලිකව ඉදිරිපත් කළයුතු අයදුම්පත භාරදී නොදීම මත අයදුම්පත් 494 ක් සඳහා බලපත්‍ර නිකුත් කර නොතිබුණි. අදාල පුද්ගලයන් විසින් දීර්ඝකාලීන බලපත්‍ර නොමැතිව ඉඩම් භුක්ති විඳිමින් සිටින්නේද යන්න සොයා බැලීම කෙරෙහි ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අවධානය යොමු වී නොතිබුණු අතර මේ හේතුවෙන් බදු ගණනය කිරීම් ක්‍රියාවලිය ප්‍රමාදවීම් තුලින් රජයට හිමිවිය යුතු බදු ආදායමක් අහිමි වී තිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

5.1 අනුයුක්ත හා කථ්‍ය කාර්ය මණ්ඩලය

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22 හි ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු වල පුරප්පාඩු 35 ක් ද, තෘතීයික මට්ටමේ තනතුරු වල පුරප්පාඩු 13 ක් ද, ද්විතීක මට්ටමේ තනතුරු වල පුරප්පාඩු 77 ක් ද සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු වල පුරප්පාඩු 18 ක් ද, පැවතුණි.

එන්.එන්.කේ.දිවාකාර
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති (වැ.බ) වෙනුවට.

නිමල් කුමාර
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

04. පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක **(ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)**

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100%-90%	**75%-89%**	**50%-74%**
1. දිස්ත්‍රික්කයේ ඉදිකිරීම් කටයුතු ආරම්භකර ඇති ව්‍යාපෘතීන් ප්‍රමාණය	✓	-	-
2. නිමවුම් වැඩ සිදු කෙරමින් පවතින ප්‍රමාණය	✓	-	-
3. ඉදිකිරීම් හි භෞතික වැඩ අවසන් කර ඇති ව්‍යාපෘති ප්‍රමාණය	✓	-	-
4. දිස්ත්‍රික්කය තුළ රාජ්‍ය අනුග්‍රහය මත ක්‍රියාත්මක වන වැඩසටහන් නියමිත කාලය තුළ සංවිධානය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කටයුතු සිදුකිරීම	√		
5. දිස්ත්‍රික්කය තුළ පරිසරය හා ස්වභාවික සම්පත් ආරක්ෂා කිරීම සඳහා වන තීරණවලට එළඹීම සඳහා සියලු පාර්ශවයන් සමග සාකච්ඡා කිරීම, අවශ්‍ය තීරණ ක්‍රියාත්මක කිරීම	√		
6. අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු මගින් දිස්ත්‍රික්කය තුළ සිදුකරන ව්‍යාපෘතීන් හා කාර්යයන් අධීක්ෂණය හා පසුවිපරම් කිරීම	√		
7. දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන සංවිධාන හා මහජන සංවිධාන අධීක්ෂණය හා පහසුකම් සැපයීම	√		
8. රජය මගින් ප්‍රමුඛ අවධානය ලබාදී ක්‍රියාකරන විශේෂ ව්‍යාපෘති දිස්ත්‍රික් මට්ටමින් සාර්ථක ලෙස ක්‍රියාවට නැංවීම	√		
9. E-Government සඳහා අවශ්‍ය වන පසුබිම සැකසීම		√	
10. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුබද්ධ සියලු රාජ්‍ය සේවකයින්ගේ ආයතන කටයුතු නිසි පරිදි සිදුවන බව තහවුරු කිරීම	√		
11. ප්‍රාදේශීය පරිපාලන කටයුතු අධීක්ෂණය කිරීම	√		
12. දිස්ත්‍රික්කය තුළ සමාජ සුභසාධනය තහවුරු කිරීම	√		
13.දිස්ත්‍රික් කෘෂිකර්ම සැලැස්ම සැකසීම හා ක්‍රියාවට නැංවීම		√	
14.දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින සියලු කාර්යය මණ්ඩලය නියමිත ආකාරයට පුහුණු කිරීම		√	
15.ඵලදායිතා සංකල්ප ප්‍රවර්ධනය හා අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම	√		

05. පරිච්ඡේදය

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

ඉලක්ක/අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50-74%	75%-100%
2024 අයවැය ප්‍රතිපාදන යටතේ වැඩසටහන් 8ක් යටතේ ප්‍රාදේශීය සංවර්ධනය ඉහළ නැංවීම තුලින් ග්‍රාමීය ජනතාවගේ විවිධ පැතිකඩ ඔස්සේ ඔවුන්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීම	දිස්ත්‍රික්කය සඳහා වෙන් වූ රුපියල් මිලියන 1,251 ප්‍රතිපාදන වලට අදාල සියළු ව්‍යාපෘති නියමිත පිරිවිතරයන්ට අනුව ඒ ඒ වැඩසටහනට අදාල නියමිත කාලයට පෙර අවසන් කිරීම	ව්‍යාපෘති 2,686ක් අවසන් කිරීම	-	-	√
දිස්ත්‍රික්කයේ පවතින දරිද්‍රතාවය හා දිළිඳුකම නිසා පහත වැටී ඇති ග්‍රාමීය ප්‍රාථමික පාසල් වල දරුවන්ගේ පෝෂණ මට්ටම වැඩි කිරීම හා දරුවන්ගේ දෛනික පාසල් පැමිණීමේ මට්ටම වැඩි කිරීම තුලින් දරුවන්ගේ අධ්‍යාපන මට්ටම වැඩි දියුණු කිරීම.	පාසල් සඳහා දිවා ආහාරය සපයනු ලබන ආහාර සැපයුම් කරුවන්ගේ පහසුකම් සංවර්ධනය කිරීම තුලින් අහාර වේලේ ගුණාත්මක භාවය හා පෝෂණ මට්ටම ඉහල නැංවීම. දරුවන් පාසල් පැමිණීමේ ප්‍රතිශතය ඉහළ නැංවීම පාසල් දරුවන්ගේ මන්ද පෝෂණය පහළ නැංවීම	බිත්තර සඳහා කිකිළියන් ඇති කිරීමේ ව්‍යාපෘති 394 ක් ස්ථාපිත කිරීම (කිකිළි පැටව් 55 බැගින්)	-	-	√

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

2024 ජාතික මැතිවරණ 2ක් පැවැත්වීම තුල මැතිවරණ නීති රීති වලට අනුගතව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සිදුවීම තුල විවිධ බාධක මතු වුවද, වැඩ සටහන් හා සම්බන්ධ වූ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සියලු නිලධාරින්ගේ දැඩි කැපවීම හා උනන්දුව මත ඉලක්ක ගත අරමුණු කරා ලඟා වීමට හැකිවීම.

06. පරිච්ඡේදය

<u>මානව සම්පත් පැතිකඩ</u>

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

		අනුමත සේවක සංඛ්‍යාව	දැනට සිටින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	16	10	6
	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	91	62	29
තෘතීයික	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	4	3	1
	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	50	38	12
ද්විතියික	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	77	121	44
	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	2241	2120	121
ප්‍රාථමික	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	30	28	2
	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	185	169	16

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

1.රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක PS/GT/2020 (III වෙළුම) හා 2022.01.03 දිනැති ලිපිය අනුව අතිරික්තව සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන් අතිරික්තයේ නොසලකා කටයුතු කරන ලෙස දන්වා ඇත. එනමුත් ද්විතියික මට්ටමේ අනෙකුත් නිලධාරීන්ගේ පුරප්පාඩු මෙම අතිරික්ත නිලධාරීන්ගෙන් පියවා ගැනීමට කටයුතු කරන ලදී.

2. ජාතික අයවැය චක්‍රලේඛ 03/2022 අනුව පුරප්පාඩු සඳහා බඳවාගැනීම් කල් තැබීම හේතුවෙන් පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට නොහැකි වීම.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය රු.		වැඩසටහනේ ස්වභාවය (දේශීය /විදේශීය)	නිමැවුම/ ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
දින 10 පාඨමාලාව කළමනාකරණ සේවා නිලධාරි 1 වන ශ්‍රේණියේ නිලධාරින්ගේ තුන්වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය	15	දින 10	92,880.00	-	දේශීය	තුන්වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයන් නිදහස්වීම
නවක ග්‍රාම නිලධාරි පුහුණු වැඩසටහන	67	දින 15	430,670.00	-	දේශීය	දැනුමෙන් පරිපූර්ණ නිලධාරින් පිරිසක් බිහිකිරීම

- මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛ 01/2024 අනුව ඒ ඒ නිලධාරින් විසින් සේවා ව්‍යවස්ථාවට අනුව සුදුසුකම් සපුරාලීම වෙනුවෙන් සම්පූර්ණ කළයුතු අනිවාර්ය පුහුණුවීම් සඳහා පමණක් පුහුණු අවස්ථා ලබාදිය යුතු බව දැන්වීම හේතුවෙන් ඉහත පුහුණු වැඩසටහනට අමතරව පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට හැකියාවක් නොමැති විය.

- පුහුණුව තුලින් නිලධාරින්ගේ ඵලදායිතාවය ඉහළ නැංවීම මගින් අරමුණ සාක්ෂාත් කරගැනීම.

07 පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය(අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.6	වෙනත්	අදාළ නොවේ		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි/පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA–N20)යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		

03	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම්සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	නැත	විගණන විමසුම් 02කට පිළිතුරු සැපයීමට වර්ෂය තුළ නොහැකි විය.	ඉදිරියේදී නියමිත පරිදි තොරතුරු ලබා ගැනීමට කටයුතු කර ඇත.
6.	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	පිළිතුරු ලැබීම් ප්‍රමාදවීම	විගණන හා කළමනාකරණ කමිටුවේදී සාකච්ඡා කර ඇත.
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-

7.	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMAවක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ	-	-
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛඅංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	නැත		නියමිත දිනට යොමු කිරීම
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	නැත	හිමිකම් නිරවුල් නොවීම හා ගැනුම්කරුවන් ඉදිරිපත් නොවීම.	හිමිකම් නිරවුල් කිරීම සිදුකිරීම.
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අදාළ නොවේ		

10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අදාළ නොවේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නෙඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම	අනුකූල වේ		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට වලට අනුකූල වීම.	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	නැත	පැවැත්වීමට නියමිතව පැවැති වැඩසටහන් හදිසි තත්ත්ව මත කල්දැමීම නිසා	නියමිත කාල සීමාව තුළ පියවා ගැනීමට කටයුතු කිරීම
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		

15.2	රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල නොවේ	1.රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය ලේකම්ගේ අංක PS/GT/2020 (III වෙළුම) හා 2022.01.03 දිනැති ලිපිය අනුව අතිරික්තව සේවයේ නියුතු සංවර්ධන නිලධාරින් අතිරික්තසේ නොසලකා කටයුතු කරන ලෙස දන්වා ඇත. එනමුත් ද්විතියික මට්ටමේ අනෙකුත් නිලධාරින්ගේ පුරප්පාඩු මෙම අතිරික්ත නිලධාරින්ගෙන් පියවා ගැනීමට කටයුතු කරන ලදි. 2. ජාතික අයවැය චක්‍රලේඛ 03/2022 අනුව පුරප්පාඩු සඳහා බඳවාගැනීම් කල් තැබීම හේතුවෙන් පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට නොහැකි වීම.	
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරතිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		

17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	නැත	රා.ප.ව 2/2018(1)මගින් කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීම අවශ්‍ය නොවන බව දන්වා ඇත.	
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂය සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදිකොට තිබීම.	අනුකූල වේ		